www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය කොලඹින් දුප්පතුන් පන්නා දැමීම අරඹයි

## Sri Lankan defence ministry begins evicting poor in Colombo

අපේ වාර්තාකරුවන් විසිනි

2010 මැයි 10

පසුගිය සෙනසුරාදා ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය මැද කොලඹ පවුල් 45ක් නිවෙස්වලින් පලවා හැරීමටත් ඔවුන්ගේ නිවාස පොලවට සමතලා කිරීමටත් හමුදාව සහ පොලිසිය මෙහෙයවූවේය. පසුගිය දිනයන්හිදී කොලඹ හා අවට ප්‍රදේශවල, මධ්‍යම පලාතේ නුවර සහ දකුනු පලාතේ ගාල්ල යන නගරවල පදික වෙලෙන්දන් දහස් ගනනක් පලවා හැරීමට මේ අයුරින්ම පොලිසිය දිගේලිකොට තිබින.

පොලිස් නිලධාරීන්ට අභිමුඛ කෙරින. මේ පවුල්වල නිවාස පිහිටා තිබුනේ මිලිටරි සේවයේ නියුක්තවූවන්ගේ ළමුන් සඳහා වන පාසලකට යාබදවය. ජනයා තම නිවාසවලින් පිටවීම ප්‍රතික්ෂේප කල විට පොලිසිය ඔවුන් ඉවතට ඇදගෙන ගියේය. ප්‍රදේශය පුරා හමුදාව යොදවනු ලැබූ අතර රැගෙන ආ බුල්ඩෝසර් වලින් ප්‍රදේශයේ මිනිසුන් බලා සිටියදීම නිවාස පොලවට සමතලා කිරීම ආරම්භ කලේය.




කොලඹ පදික වෙලෙන්දන් තම තාවකාලික වෙලඳ කුටි පොලීසිය විසින් විනාශ කිරීමෙන් පසු

කොලඹ කොම්පඤ්ඤ වීදිය ප්‍රදේශයේ මියුස් වීදියේදී සියගනනක් මිනිසුන් ඔවුන් පලවා හැරීමට බලමුලු ගන්වා සිටි කැරැලි මර්දන පොලිසිය ඇතුලු,

තමන් සන්තකව නිවාසවලට නීතිමය අයිතියක් ඇතයි විවාද කරමින් නිවැසියන් ඉවත්ව යාම ප්‍රතික්ෂේප කරනවිට කැරලි මර්දන පොලිසිය ඔවුන්ට

දරුනු ලෙස බැටන් ප්‍රහාර දී පලවා හැරියහ. හමුදා සාමාජිකයෝ මාධ්‍යවේදීන්ගේ කැමරාවල සටහන්ව තිබූ ප්‍රහාරයේ පින්තූර මකා දැමූහ.

මෙම ප්‍රහාරයන්, රටේ ප්‍රධාන නගරවලින් දුප්පතුන් පලවා හැරීම සහ මහා ව්‍යාපාරික සංවර්ධකයින් උදෙසා තත්‍ය දේපල මුදාහැරීම එල්ල කරගත් නැවත බලයට පත් ආන්ඩුවේ පුලුල් සැලස්මක කොටසකි. පසුගිය මහමැතිවරනයෙන් අනතුරුව නව ආන්ඩුව ස්ථාපිත කිරීමෙන් දින කීපයකට පසු ජනාධිපති මහින්ද රාජපක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය (යූඩීඒ) ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනය යටතට පවරා දුන්නේය. ජනාධිපතිගේ සහෝදරයෙක් වන, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යූඩීඒහි සභාපති වසයෙන් පත් කලේය.

නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කිරීම ශ්‍රී ලංකා සමාජය තවදුරටත් මිලිටරිකරනය කිරීමේ සලකුනකි. එය, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව ගෙනගිය යුද්ධයේදී උතුරු නැගෙනහිර දෙමල ජනයාට විරුද්ධව යෙදූ විෂකුරු මිලිටරි විධික්‍රම සමස්ත දිවයිනේම කම්කරු පන්තියටම විරුද්ධව මුදාහරිනු ඇති බවට තවත් ඇඟවුමකි.

පිලිවෙලින් බලයට පත් ආන්ඩු 1977 සිට ම අවස්ථා ගනනකදී කොලඹ පදික වෙලෙඳුන් පලවා හැරීමට වෑයම් කලත් එයට මතුවූ විරුද්ධත්වය මැද ආපසු හැරුනේය. ආරක්ෂක අමාත්‍යාංශය යටතට නගර පත් කිරීමෙන් ආන්ඩුව බලාපොරොත්තු වන්නේ, මහා පරිමාන ව්‍යාපාර සඳහා සුදුසුයැයි හඳුනාගත් ප්‍රදේශවල ජීවත්වන දිලිඳු ජනයා ඒවායෙන් බලහත්කාරයෙන් පලවා හැර ඒවා හිස්කර ගැනීම පිනිස යුද ක්‍රියාදාමයේදී ගොඩ නඟා ගත් මිලිටරි යාන්ත්‍රනය උපයෝගි කර ගැනීමටයි.

විදේශීය ආයෝජකයින් සහ සංචාරකයින් ආකර්ෂනය කරගැනීමට කොලඹ ද ඇතුලු ප්‍රධාන නගරවල ව්‍යාපෘති කීපයක් ආන්ඩුව සැලසුම් කර තිබේ. යූඩීඒයට අනුව "සංශෝධිත කලාපකරන සැලස්මක්" පදනම් කර ගනිමින් කොලඹ නගරය "හර ප්‍රදේශය" බවට පත් කෙරෙන අතර, "වරාය සම්බන්ධ කටයුතු, බැංකු කටයුතු, මූල්‍යමය සහ රක්ෂන අංශයන්" එහි මූලික වශයෙන් සිදු කෙරෙනු ඇත. කොලඹ නගරය මධ්‍යයේ සිට කිලෝමීටර් පහක් දුරින් පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේහි පරිපාලන කාර්යාල යලි ස්ථානගත කිරීමට ආන්ඩුව සූදානම් වේ. කොලඹ පිහිටි කර්මාන්ත නගරයෙන් දුර පිහිටි නිදහස් වෙලඳ කලාපයන්හි ස්ථාන ගත කෙරෙනු ඇත.



**නිවාස සමතලා කරන බුල්ඩෝසර්**

උතුරේ පැරනි යුද කලාපයේ සංචාරයක නිරත වෙමින් සිටි ගෝඨාභය රාජපක්ෂ පදික වෙලෙඳුන් පලවා හැරීම සහ දුප්පත් ජනයාගේ නිවාස කුඩුපට්ටම් කිරීමට යටින් පවත්නා ආන්ඩුවේ පුලුල් අරමුන ප්‍රකාශ කලේය. පැල්පත් සහ අනෙකුත් "නීති විරෝධී ඉදිකිරීම්" "අශෝභන" බවත් ඒවා කොලඹින් ඉවත් කල යුතු බවත් ඔහු කිලිනොච්චියේදි මාධ්‍යයට පැවසීය. සංචාරකයන්ට කොලඹ නගරය ආකර්ෂනීය කරනු වස් මෙම නිවැසියන්ට නව නිවාස සම්පාදනය කල යුතු බැව් ඔහු සඳහන් කලේය.

ආන්ඩුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව කොලඹ වැසියන්ගෙන් සියයට 54ක් පැල්පත් වැසියන්ය. ඔවුහු අක්කර 1000කට ආසන්නව ප්‍රධාන භූමිය "නීතිවිරෝධී" ලෙස අත්කර ගෙන සිටිති. "පුරවැසියන්ට ඉමහත් කරදරයක් වෙමින් සහ සංවර්ධනයට බාධා පමුනවමින්" නගරයේ සම්පත් අපතේ යවමින් සිටීම පිලිබඳව අධිකාරීහු දුප්පතුන්ට චෝදනා නැගූහ.

කොලඹ පදික වෙලෙඳුන් පලවා හැරීම යුක්ති සහගත කිරීමට ආන්ඩුව සහ මාධ්‍ය කියා පාන්නේ, එම ක්‍රියාව පදිකයන්ට හිතැති පියවරක් සහ අපරාධ තුරන් කිරීමට අවශ්‍යව තිබූවක් බවයි. "අපරාධකරුවන් වෙනුවෙන් දේශපාලනඥයින් නගන කන්කෙඳිරිලි නොතකා සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අන කිරීමේ" ඔහුගේ "බුරුලක් නොදෙන" ස්ථාවරය වෙනුවෙන් ආන්ඩුවේ ඩේලි නිව්ස් පුවත්පතේ පසුගිය

සිකුරාදා කතුවැකියෙන් ගෝඨාභය රාජපක්ෂට හුරේ දැම්මේය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවන් ඊයේ දින කොම්පඤ්ඤ වීදියට යන විට මිනිසුන් සිය ගනනක් තවමත් වීථිවල සහ යාබද ගොඩනැගිලිවල රැඳී හුන්හ. පොලිසිය දිගේලි කොට තිබූ අතර යාබද මංසන්දිවල හමුදා භටකන්ඩායම් රඳවා තිබුනි. සතියකට පෙරාතුව තමන් කැඳවූ යූඩීඒය මැයි 8 වෙනිදා තම නිවෙස් කඩාබිඳ දමන බව නිවේදනය කල බව නිවැසියෝ කෝපයෙන් විස්තර කලහ.

එක් ප්‍රදේශවාසියෙක් මෙලෙස විස්තර කලේය: "අපි ජීවිතය ගැට ගහගන්නෙ පදික වෙලෙන්දන් විදියට. කිලෝමීටර් 4ක් විතර ඇතින් තියෙන තාවකාලික මඩු වලට යන්න කියලා අපට කියනවා. ඒවාට වැසිකිලි නෑ, ඒ මඩු ජීවත් වෙන්න සුදුසු ඒවා නෙවෙයි. අපේ ගෙවල් විනාශ කරන්න ඔවුන්ට "ඉහලින්" නියෝගයක් ආ බව යූඩීඒ නිලාධාරියෙක් කිව්වා."

"මම හිතන්නේ ආරක්ෂක විද්‍යාලයට මේ පලාත හිස් කරනවා කියලා. අපිට රුපියල් 5,000ක් ගෙව්වා. ඒත් ඒ සල්ලි අපි ගත්තෙ නෑ. ඔවුන් කිව්වා මේ ගොඩනැගිලි හදලා තියෙන්නේ නීති විරෝධිව කියලා. ඒක පචයක්. අපේ මිනිස්සු අවුරුදු 80ක් විතර මෙහෙ ජීවත් වෙලා තියෙනවා. අපිට නීතිමය ලියකියවිලි තියෙනවා."

"මේක පටන්ගෙන තියෙන්නේ ආරක්ෂක ලේකම්. මේක පලවෙනි පියවර විතරයි." තවත් වැසියෙකු ප්‍රකාශ කලේය. ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථිකමය විස්මයක් කරන බවට ජනාධිපති රාජපක්ෂගේ කියාපෑම සිහිපත් කරමින් "ආසියාවේ විශ්මය මේකද?" ඔහු විමසීය. "සිංහල, මුස්ලිම් සහ දෙමල මිනිසුන් සාමකාමීව මෙහෙ ජීවත් වෙලා තියෙනවා. ආන්ඩුව දුප්පත් මිනිස්සුන්ට සලකන විදිය මේකද?"

පාසල් සිසුවෙකු මෙසේ සඳහන් කලේය. "ට්‍රැක්ටර් එනවා, අපේ ගෙවල් කඩනවා ඊයේ මම දැක්කා. මට මාස ගානකට ආයෙ ඉස්කෝලෙ යන්ට බැරිවෙයි. මගේ ඉස්කෝල බෑග් එකයි ඇඳුනුයි සුන්බුන්වලට යටවෙලා. මම අඬනවා, මගේ අම්මත් අඬනවා. අනේ මගේ අම්මගෙයි, ආච්චි අම්මගෙයි ගෙවල් කඩන්න එපා."

බොහෝ පදික වෙලෙඳුන් තම කෝපවේගය පිට කලෝය. "අපේ බිස්නස් නැතුව අපි කොහොමද ජීවත් වෙන්නේ? අපේ ළමයි කන්නේ කොහොමද, ඉස්කෝලෙ යන්නේ කොහොමද? මේක හරි අසාධාරනයි. අපිට සාධාරන විසඳුමක් ඕන. වැඩිහරියක් පදික වෙලෙන්දෝ මැතිවරනවලදී ආන්ඩුවටයි සහය දුන්නේ, ඒත් ඡන්දවලින් පස්සේ ආන්ඩුව අපිව තුට්ටුවකට මායිම් කරන්නේ නෑ." එක් අයෙක් සඳහන් කලේය.

වැඩෙන වෛරය මධ්‍යයේ ජනාධිපති රාජපක්ෂ මැයි 04 වෙනි දින කොලඹ පිටකොටුව ප්‍රදේශයේ පදික වෙලෙඳුන්ගේ සංගමයේ නියෝජිත පිරිසක් සමග හමුවක් පැවත් වූවේය. කුඩා වෙලඳ කුටි දහසක් සඳහා පලාතෙන් ඉඩමක් හා ඉදිකිරීම අවසන් වනතෙක් වෙලෙන්ඳන්හට සති දෙකක කාලයක් දක්වා දිනකට රුපියල් 2,000 බැගින් ලබා දීමටත් පොරොන්දු විය. මෙම මූන බේරා ගැනීමේ ක්‍රියාව පිලිබඳ විශ්වාසයක් පදික වෙලෙඳුන්ට නොමැති අතර අලුත් ස්ථානයෙන්ද ඔවුන් ක්‍රමක්‍රමයෙන් පලවා හරිනු ඇතයි ඔවුහු බියට පත්ව ඇත.

ගම්බද දුගීන් සහ වතුකර පවුල්ද ඇතුලුව, රටේ ජනගහනයේ දරිද්‍රතම කොටස්වලින් ඇදී ආ 20,000ක පමන පදික වෙලෙඳුන් පිරිසක් කොලඹ නගරයේ පමනක් ජීවත් වෙති. ඔවුන්ගෙන් ඇතමුන් තම සුලු ව්‍යාපාරයේ නිරතව සිටින්නේ දශක ගනනක් තිස්සේය.

දකුනු පලාතේ මාතර නගරයට යාබද මිදිගම නමැති ගමෙන් පිටව ආ දා පටන් සුගත් සහ ඔහුගේ පියා, පියසිරි, කොලඹ කොටුව දුම්රියපොල ඉදිරියේ වසර 15ක් තිස්සේ ඇඳුම් විකුනමින් සිටියෝය. සුගත් සිතන්නේ මෙම වෙලෙඳුන්ගෙන් හිස්කල භූමිභාගය ආන්ඩුවේ ආධාරකරුවන්ට ලබා දෙනු ඇති බවයි.

"මගේ මාමාගේ පුතාත් රස්සාව කරන්නේ පදික වෙලෙන්දෙක් විදියට. ඉස්කෝලෙ යන ළමයි තුන් දෙනෙක් මට ඉන්නවා. අපේ ජීවිකාව නැතිව අපි කොහොමද ලමයින්ට කන්ට දෙන්නේ? වෙනත් කිසිම රැකියාවක් ගැන අපි දන්නේ නෑ" ඔහු කීවේය.

වෙලෙන්දෝ ආන්ඩුවේ මැතිවරන පොරොන්දු ගැන අවඥා සහගත අයුරින් සිහිපත් කලෝය. අයෙක් මෙලෙස සඳහන් කලේය: "අපි දුප්පත් මිනිස්සු. මැතිවරන කාලෙදි ආන්ඩුව කිව්වේ දිනුවොත් අපි

අමතක කරන්නේ නෑ කියලයි. ඒත් දැන් මොකද වෙලා තියෙන්නේ? අපව පාතාලයට තල්ලු කරලා දාලා."

කොලඹට යාබද බොරැල්ලේ රෙදි විකුනන තවත් සුලු වෙලෙන්දෙක් කීවේ ජීවත් වීමට ඔහු වෙනත් ක්‍රමයක් නොදන්නා හෙයින් වෙලෙන්ඳන් පලවා හැරීමෙන් පසු තමන් අවදානමකට මුහුන දී ඇති බවයි. "මට මගේ ලමයි ඉස්කෝලෙ යවන්න තියෙනවා. ජීවන වියදම උහුලන්න බැරි තරම්. මගේ දෛනික කෑමවලට මම රුපියල් 300ක් වියදම් කරනවා. අපේ ආදායම එකඑක දවසට වෙනස් වෙනව, ඒක යාන්තම් ජීවත් වෙන්න ප්‍රමානවත්. විකුනන්න බඩු ගන්න ඇති තරම් සල්ලි අපි ලඟ නෑ, ඒක නිසා අපි මුදල් නයටයි ගන්නේ. ඒවාට දිනපතා ගිනිපොලියක් ගෙවන්න වෙනවා. ආන්ඩුවේ තීරනය නම් අන්තිම අසාධාරනයි", ඔහු කීවේය.

දුගීන්ට එරෙහි ආන්ඩුවේ මෙම ප්‍රහාරය සමස්ත කම්කරු පන්තියට ම කරන ලද අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු ය. පසුගිය වසරේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ඩොලර් බිලියන 2.6 වෙනුවෙන් පැනවූ කොන්දේසි සැපිරීම සඳහා ආන්ඩුව ක්‍රියාවට දමමින් සිටින දරුනු කප්පාදු පිලිවෙත්වලට විරෝධය පෑමට ඉදිරියට එන වැඩකරන ජනයාට ද ආන්ඩුව සලකනු ඇත්තේ මෙම ම්ලේච්ඡ ආකාරටම ය.

© www.wsws.org